# අවවාදයයි !

## ස්වයං නිරෝධායනය සඳහා වෙන්කර ඇති ස්ථානයකි

1897 අංක 3 දරණ නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනත සහ නිරෝධායන රෙගුලාසි ප්‍රකාර ව, මෙහි සියලු නිවැසියන් විසින් පහත පරිදි ක්‍රියාකළ යුතු ය.

- රෝග ලක්ෂණ පිළිබඳ ව අවධානයෙන් සිටීම.
- නිවසේ ම රැඳී සිටීම සහ නිවස තුළ සිටින අන් අයගෙන් ද වෙන්ව සිටීම.
- අන් අය සමග ගැවසීමේ දී අවම වශයෙන් මීටරයක් පමණ දුරස්ථව සිටීම.
- සෞඛ්‍ය ආරක්ෂිත මුඛ ආවරණයක් පැළඳීම.
- කසින විට හෝ කිවිසින විට මුව ආවරණය කර ගැනීම.
- නිරන්තරයෙන් සබන් යොදා අත් සේදීම.
- නිවසේ භාවිත කරන දෑ අනෙක් අය සමග හුවමාරු කර ගැනීමෙන් වැලකීම.
- ස්වයං නිරෝධායනය ආරම්භ කළ දින සිට අවම වශයෙන් දින 14 ක් මෙම ක්‍රමය අනුගමනය කිරීම.
- භාවිත කරන දෑ පිරිසිදු කර ගැනීම සහ ඉවතලන දෑ විනාශ කිරීම.
- ඉවත දැමිය හැකි භාජනයක ආහාර ලබාදීම සහ රෝගියාටම වෙන් වූ වැසිකිළි හා නාන කාමර භාවිත කිරීම.

**මෙම කාලය තුළ රෝග ලක්ෂණ මතුවුවහොත් වහාම පහත අංක අමතන්න.**

011 - 2444480, 011 - 2444481, 011 - 5978720, 011 - 5978730, 011 - 5978734, 011-3071073
071 - 0107107, 117 හෝ 119 නැතහොත් lahd@police.lk ලිපිනයට ඊ-මේල් කරන්න.

**ඉහත නිරෝධායන උපදෙස්වලට පටහැනිව ක්‍රියාකළ අවස්ථාවක දී ...**

- නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ එවැනි තැනැත්තකු,
  - නිරෝධායන ක්‍රියාවලියට අනුගත කරනු ලැබේ.
  - ගමන්බිමන් සීමා කිරීමට යටත් වේ.
  - අන් අයගෙන් වෙන් කර තැබීම හෝ ප්‍රතිකාර සඳහා බලහත්කාරයෙන් වුව ද යොමු කරනු ලැබේ.
  - වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවටගෙන නඩු පවරනු ලැබේ.
  - වරදකරුවකු වුවහොත් මාස 06 ක් දක්වා සිර දඬුවම් සහ / හෝ රු.2,000/- සිට රු.10,000/- දක්වා දඩයකට ලක්විය හැකි ය.

- එමෙන් ම, නොසැලකිල්ලෙන් හෝ හිතාමතා ම හෝ ද්වේශසහගතව රෝගය පැතිරීමට ඉඩ හැරියහොත්, රෝගය පැතිරවුවහොත් හෝ නිරෝධායන රීති අනුගමනය නොකළහොත් එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද,
  - වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබේ.
  - වරදකරු වුවහොත් වසර 02 දක්වා සිර දඬුවමකට ද රු.1,500/- ක දඩයකට ලක් විය හැකි ය.

- ඉහත වැරදි සඳහා අනුබලදෙන තැනැත්තකු ද වරදක් කරන අතර, එවැනි තැනැත්තන් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන නඩු පවරනු ලබන අතර, වරදකරු වුවහොත් ඉහත දඬුවම්වලටම යටතේ වේ.
- ඉහත වැරදි සඳහා යොදාගත් නිශ්චල / චංචල දේපළ ද තහනමට ලක්විය හැකිය.

**පොලිස්පති - ශ්‍රී ලංකා පොලීසිය**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව